# කර්මාන්ත

## සමස්ත උපනතීන්

කාර්මික නිෂ්පාදන, අපනයන සහ එකතු වූ අගයන්හි ඇති වූ ඉහළ යාම් වලින් පිළිබිඹු වූ පරිදි 1990 වර්ෂයේදී කර්මාන්ත අංශයේ කැපී පෙනෙන වර්ධනයක් ඇතිවිය. රටේ බොහෝ පලාත්හි පැවති කලබලකාරී තත්වය යහපත් අතට හැරීමත් සමඟ කාර්මික කටයුතු වල ඇතිවූ පුනර්ජීවනය මෙයට බෙහෙවින්ම හේතුවිය. 1990 වර්ෂයේ කාර්මික නිමැවුමේ වටිනාකම මූර්ත වශයෙන් සියයට 14 කින් වර්ධනය වූ අතර එය 1984 න් පසු වාර්තා වූ ඉහළම වර්ධන මට්ටමයි. කාර්මික නිෂ්පාදනයේ මෙම සිත්ගන්නා සුළු වර්ධනය ඇති වීමට ඉවහල් වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නොකඩවා ඇතිවූ ප්‍රසාරණය සහ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි පෙන්නුම් කළ යහපත් ක්‍රියාකාරීත්වයයි. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි නිමැවුම සියයට 14 බැගින් වර්ධනය විය.

පෞද්ගලික අංශයේ නිෂ්පාදන වැඩිවීම් සෑම කාර්මික ගණයකින්ම වාර්තා විය. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ යන ගණයන්හි නිෂ්පාදන විශාල වශයෙන් වැඩි විය. රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි ඇතිවූ නිමැවුමෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම බලපෑවේ තෙල් පිරිපහදුවේ නිමැවුම් මට්ටමෙහි ඇතිවූ සැළකිය යුතු වැඩිවීමයි.

කාර්මික අපනයනයන්හි අගය 1989 රුපියල් දශ ලක්ෂ 28,470 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 41,510 දක්වා ඉහළ ගිය අතර, මුළු අපනයන ඉපැයුම් තුළ අන්තර්ගත කාර්මික අපනයනයන්ගේ සාපේක්ෂ කොටස 1989 දී සියයට 51 සිට 1990 දී සියයට 52 දක්වා වැඩිවුණි. නිමි ඇඳුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත වලට කාර්මික අපනයනයන්හි තවදුරටත් ප්‍රමුඛත්වය ලැබුන අතර, එහි අගය මුළු කාර්මික අපනයන වටිනාකමෙන් සියයට 70 ක් පමණ විය.

### කාර්මික ප්‍රතිපත්තිය

1989 අවසාන භාගයේදී කර්මාන්ත, විද්‍යා කටයුතු සහ තාක්ෂණ අමාත්‍යාංශය මගින් හඳුන්වා දෙනු ලැබූ නව කාර්මිකරණ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවරවල් 1990 වර්ෂයේදී ගන්නා ලදී. විදේශීය ආයෝජකයනට ආයෝජන කටයුතු වලදී පහසුකම් ලබා ගත හැකි තනි ආයතනයක් ඇති කිරීමේ අදහසින් 1990 ජනවාරි මාසයේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) සහ විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) ඒකාබද්ධ කරන ලදී. එමෙන්ම විදේශීය ආයෝජනය සම්බන්ධයෙන් පැවැති අනුමත කිරීමේ ක්‍රියා පරිපාටියද සරල එකක් බවට පත් කරන ලද අතර, 1990 ජූනි මස සිට පූර්ව අවසරයක් නොමැතිව පවත්නා සමාගම්වල කොටස්වලින් සියයට 40 ක් දක්වා මිළදී ගැනීමට විදේශිකයනට අවසර ලබා දී ඇත.

1990 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය මගින් රාජ්‍ය ව්‍යාපාරික ආයතන ගණනාවක්ම සීමිත වගකීම් සහිත සමාගම් බවට පත්කිරීම සඳහා අනුමැතිය දෙන ලදී. මේවාට තුල්හිරිය පෙහෙකම්හල, පූගොඩ පෙහෙකම්හල, ලංකා ඔක්සිජන් සමාගම, දංකොටුව පෝසිලේන්, වේයන්ගොඩ පෙහෙකම්හල, මත්තේගම පෙහෙකම්හල, ලංකා මිල්ක්ෆුඩ්ස්, තෙල් සහ මේද, කැළණි ටයර්, ලංකා සම් භාණ්ඩ, ලංකා තුනීලැලි සහ රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව යන රාජ්‍ය ආයතන අයත් විය.

### නිෂ්පාදනය

1989 වසරේ සියයට 6 ක් වූ කාර්මික නිමැවුම් වර්ධනය හා සසඳන කළ 1990 දී, කාර්මික නිමැවුම්හි වටිනාකම මූර්ත වශයෙන් සියයට 14 කින් සැළකිය යුතු ලෙස වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සියයට 14 ක ප්‍රසාරණයක් සහ

රාජ්‍ය අංශයේ ඇතිවූ එවැනිම වර්ධනයක සාමූහික ප්‍රතිඵලයක් ලෙස මෙම ඉහළ වර්ධන අනුපාතිකය වාර්තා විය. ඛනිජ තෙල් නිෂ්පාදන වටිනාකම බැහැර කළ විට, කාර්මික නිෂ්පාදනය සියයට 7 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1990 දී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 37) , මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 24) , රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 13) , සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 12) , කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (සියයට 9) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 7) ය.

රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයේ නිමැවුම සැළකිය යුතු ලෙස ඉහළ යාමට මූලික වශයෙන් බලපෑවේ ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නිමැවුමේ ඇතිවූ සීඝ්‍ර වැඩිවීමයි. මෙම කාර්මික ගණයේ පෞද්ගලික අංශයේ නිෂ්පාදනය ද සියයට 10 කින් වැඩි වූ අතර එය තීන්ත, වාර්නිෂ්, සබන්, සුවඳවිලවුන්, ප්ලාස්ටික් සහ රබර් වැනි නිෂ්පාදිතයන් ගණනාවක නිමැවුම වැඩිවීම තුලින් පිළිබිඹු විය. ආයෝජන ප්‍රවර්ධන කලාපයන් තුල මෙන්ම ඉන් පිටත ද පිහිටි සකස් කළ ඇඟලුම් කර්මාන්තයන්හි නොකඩවා පැවති වර්ධනය රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම් සඳහා ප්‍රධාන වශයෙන් දයක විය. කෙසේ වුවද, මෙම ගණයට අයත් රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 44 කින් සැළකියයුතු ලෙස පහත වැටීමක් වාර්තා කර ඇති අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තුල්හිරිය සහ පූගොඩ කර්මාන්තශාලා පෞද්ගලිකරණය කිරීම හේතුකොටගෙන ජාතික පේෂකර්ම සංස්ථාවේ අඩුවූ නිමැවුමයි. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත ගණය තුල නිමැවුමේ වැඩිවීම් ප්‍රධාන වශයෙන් වාර්තා වූයේ දුම්කොළ, සීනි, තේ පැකට්, සිසිල් බීම, මත්පැන් නිෂ්පාදිත, රසකැවිලි සහ එළවළු තෙල් හා මේද නිෂ්පාදනයේ නියැලුණු පෞද්ගලික අංශයේ කර්මාන්තවලය. කෙසේ වුවද, ලංකා තෙල් හා මේද සහ ජාතික ලුණු යන සංස්ථාවන්හි නිමැවුමෙ සැළකිය යුතු පහළ බැසීම මෙම කාර්මික ගණයේ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි නිෂ්පාදනයේ අඩුවීමට හේතු විය.

ජාතික කඩදාසි සංස්ථාව මෙන්ම පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නිමැවුම, කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම සඳහා බෙහෙවින් ඉවහල් විය. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත ගණය තුල නිමැවුමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් වාර්තා වූයේ වීදුරු සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයේ නියැලුණු පෞද්ගලික අංශයේ කර්මාන්තවලය. වානේ සංස්ථාවේ වැඩි වූ නිෂ්පාදනය මූලික ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම සඳහා බලපෑවේය. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සහ ව්‍යුහමය ලෝහ නිෂ්පාදිත වැනි නිෂ්පාදිතයන් ගණනාවක ඇති වූ නිමැවුමේ ඉහළ යාම ප්‍රධාන වශයෙන් සකස් කළ ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයේ වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වය කෙරේ බෙහෙවින් බලපෑවේය.

පවත්නා අගයයන් අනුව කාර්මික නිෂ්පාදනයේ වටිනාකම 1990 දී සියයට 34 කින් වැඩිවූ බවට ඇස්තමේන්තු කර ඇත. රසායනික ද්‍රව්‍ය සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සියයට 76 කින් ඉහළ ගිය අතර, සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 32 කින්ද, කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත සියයට 29 කින්ද, මූලික ලෝහ නිෂ්පාදිත සියයට 27 කින්ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 26 කින්ද, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සියයට 27 කින්ද, ආහාර, පාන වර්ග හා දුම්කොළ සියයට 19 කින් සහ දව සහ දව නිෂ්පාදිත සියයට 8 කින්ද වර්ධනය විය.

## 1.18 සංඛ්‍යා සටහන

### කාර්මික නිෂ්පාදන වටිනාකම 1986—1990 (වර්තන මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1986 | 1987 | 1988 | 1989* | 1990(අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 12,129 | 12,962 | 14,675 | 18,458 | 21,955 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 12,088 | 15,428 | 18,166 | 22,073 | 27,930 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 632 | 677 | 640 | 667 | 721 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 1,289 | 1,372 | 1,492 | 1,456 | 1,880 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 11,088 | 13,477 | 13,681 | 12,041 | 21,215 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 2,053 | 2,156 | 2,267 | 6,007 | 7,554 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 281 | 307 | 487 | 792 | 1,006 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 1,757 | 2,006 | 2,477 | 3,182 | 4,199 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 136 | 155 | 178 | 231 | 296 |
| එකතුව .. | 41,453 | 48,540 | 54,063 | 64,907 | 86,756 |

(අ) තාවකාලික
* සංශෝධිත

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### රාජ්‍ය අංශයේ කර්මාන්ත


පසුගිය වසරේ දක්නට ලැබුණු සියයට 21 ක අඩුවීමට ප්‍රතිවිරුද්ධව 1990 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම මූර්ත වශයෙන්, සියයට 14 කින් වැඩිවිය. ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදන මට්ටම ඉහළ යෑම රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ සැලකියයුතු වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය. ඛණිජ තෙල් සංස්ථාවේ දයකත්වය බැහැර කළවිට රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 21 කින් පහත වැටුණි.

නිමැවුම්හි පහත වැටීම් වාර්තා කළ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වූයේ ජාතික ලුණු (සියයට 64), ජාතික පේෂකර්ම (සියයට 45), ලංකා තුනීලැලි (සියයට 42), ලංකා ඛණිජ වැලි (සියයට 35), ලංකා තෙල් සහ මේද (සියයට 16) සහ ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 5) යන සංස්ථාවන්ය.

ජාතික ලුණු සංස්ථාවේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උතුරු ප්‍රදේශයේ පැවැති අසතුටුදයක ආරක්ෂක තත්ත්වයන් නිසා ලුණු ලේවායයන්හි නිමැවුම පහත වැටීමයි. ජාතික පේෂකර්ම සංස්ථාවේ නිමැවුමෙහි සීඝ්‍ර පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ 1990 වර්ෂය තුලදී තුල්හිරිය සහ පූගොඩ පෙහෙකම්හල්හි අයිතිය රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශයට මාරු කිරීමයි. නැගෙනහිර ප්‍රදේශයේ පැවති කලබලකාරි තත්ත්වයන් නිසා පුල්මුඩෙ කර්මාන්තශාලාවේ අඩුවූ නිමැවුම් මට්ටම මූලික වශයෙන් ලංකා ඛණිජ වැලි සංස්ථාවේ නිෂ්පාදනය පහත වැටීමට බලපෑවේය. " ක්ලින්කර් " සැපයුම ප්‍රමාණවත් පරිදි සිදු නොවීම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. අලෙවි කිරීමේ ගැටළු, තෙල් හා මේද සමාගමේ නිමැවුම අඩුවීම කෙරෙහි බලපෑවේය.

වර්ෂය තුළදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ සංස්ථාවන් වූයේ ස්කාගාර සමාගම (සියයට 158), ලංකා ඛණිජ තෙල් (සියයට 49), ලංකා සම් භාණ්ඩ (සියයට 35), රාජ්‍ය පතල් කැනීම් සහ ඛණිජ සංවර්ධන (සියයට 29), රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයට 22), ලංකා පිහන් (සියයට 17), කැළණි ටයර් (සියයට 10), ලංකා වාණේ (සියයට 5) සහ ලංකා ලෝහ (සියයට 4) යනාදියයි

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙහි මුළු වටිනාකමෙන් අඩකට පමණ දායක වන ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඛනිජ තෙල් පිරිපහදුව බාධාවකින් තොරව වර්ෂය පුරා ක්‍රියාත්මක වීමයි. වර්ෂය තුලදී රා එකතු කරන ප්‍රදේශවල පැවැති යහපත් කාලගුණ තත්ත්වයන් නිසා රා සැපයුමෙහි ඇති වූ සීඝ්‍ර වැඩිවීම රාජ්‍ය ස්කාගාර සංස්ථාවේ නිෂ්පාදනය වැඩිවීමට විශාල වශයෙන් හේතු විය. ප්‍රමාණවත් අමු ද්‍රව්‍ය සැපයුම, ලංකා සම් භාණ්ඩ සංස්ථාවේ වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය පතල් කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ වැඩිදියුණු වූ නිමැවුම් මට්ටම එහි ඉහළ මට්ටමක පැවැති ධාරිතා උපයෝජනය තුලින් පිළිබිඹු විය. වර්ෂය තුලදී පැවැති යහපත් කාලගුණ තත්ත්වයන් සහ ක්‍රේප් රබර් සඳහා ඉහළ මිල ගණන් ලැබීම, රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගමේ වැඩිවූ නිෂ්පාදනයට ප්‍රධාන හේතුව විය.

### 1.19 සංඛ්‍යා සටහන

### රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1988—1990
### (1977 = 100)

| කාර්මික ගණය | 1988 | 1989 | 1990(අ) |
|---|---|---|---|
| 1· ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 31·0 | 26·2 | 22·6 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 189·7 | 173·7 | 96·6 |
| 2·1 රෙදිපිළි | 257·6 | 236·2 | 128·2 |
| 3· දුව හා දුව නිෂ්පාදිත | 70·9 | 31·2 | 22·2 |
| 4· කඩදසි හා කඩදසි නිෂ්පාදිත | 153·7 | 107·9 | 118·1 |
| 5· රසායනික නිෂ්පාදිත | 119·3 | 83·6 | 122·4 |
| 5·1 ඛනිජ තෙල් | 120·7 | 83·6 | 124·3 |
| 6· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 142·4 | 137·2 | 137·5 |
| 6·1 සිමෙන්ති | 175·1 | 164·8 | 156·6 |
| 7· මූලික ලෝහ නිෂ්පාදිත | 86·1 | 76·4 | 80·3 |
| 8· සකස් කළ ලෝහ නිෂ්පාදිත | 70·3 | 32·5 | 33·6 |
| සියළුම ගණයයන් | 114·0 | 88·0 | 100·0 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 106·5 | 93·0 | 73·0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

කාර්මික ගණයයන් අනුව රාජ්‍ය ව්‍යවසායයන් වර්ග කිරීමේදී 1990 වර්ෂයේදී ඉහළම වර්ධනයක් (සියයට 46) වාර්තා කළ අංශය වූයේ රසායනික හා ඛණිජ තෙල් නිෂ්පාදන අංශයයි. කඩදසි හා කඩදසි නිෂ්පාදිත (සියයට 9), මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 5) සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 4) යන කාර්මික ගණයයන් නිමැවුම් වැඩිවීම් වාර්තා කළ අනෙකුත් අංශයන් විය. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත (සියයට 44) ; ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 14) සහ දුව හා දුව නිෂ්පාදිත (සියයට 12) යන ගණයයන් නිමැවුමේ අඩුවීම් වාර්තා කළේය.

වර්ෂය තුලදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් ගණනාවකට ලාභ ඉපැයීමට හැකි විය. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (රු. ද. ල. 345), ලංකා පිහන් (රු. ද. ල. 125), කැළණි ටයර් (රු. ද. ල. 116), සිලෝන් ඔක්සිජන් (රු. ද. ල. 51), වේයන්ගොඩ පෙහෙකම්හල (රු. ද. ල. 49), රාජ්‍ය පතල් කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාව (රු. ද. ල. 43), ලංකා වානේ සංස්ථාව (රු. ද. ල. 11), ජාතික ලුණු සංස්ථාව (රු. ද. ල. 8), රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගම (රු. ද. ල. 5) සහ ලංකා තෙල් හා මේද (රු. ද. ල. 2) 1990 වර්ෂයේදී ලාභ පෙන්වූ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් විය.

වර්ෂය තුලදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්ට වර්ෂයේ අයවැය ලේඛනය මගින් වෙන් කරන ලද සංක්‍රාම රු. ද. ල. 111 ක් විය. මෙය පසුගිය වර්ෂය සමග සසඳන කල සියයට 71 ක අඩුවීමකි. වර්ෂය තුලදී ශ්‍රී ලංකා සීනි සමාගම සහ ජාතික පේෂකර්ම සංස්ථාව පිළිවෙලින් රු. ද. ල. 69 ක් සහ රු. ද. ල. 42 ක් ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන් ලබා ගත්තේය.

### 1.20 සංඛ්‍යා සටහන

### කාර්මික ව්‍යවසායයන්ට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1988—1990

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 (අ) | 1988 | 1989 | 1990 (අ) | 1988 | 1989 | 1990 (අ) |
| 1. ජාතික කඩදාසි සංස්ථාව .. | — | — | — | 7·6 | — | — | 7·6 | — | — |
| 2. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය .. | 131·4 | 107·0 | 68·6 | — | 225·0 | — | 131·4 | 332·0 | 68·6 |
| 3. ලංකා වානේ සංස්ථාව .. | — | — | — | 48·3 | — | — | 48·3 | — | — |
| 4. ජාතික කිරි මණ්ඩලය .. | 2·5 | — | — | 28·9 | — | — | 31·4 | — | — |
| 5. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව .. | — | — | — | 1·2 | — | — | 1·2 | — | — |
| 6. රාජ්‍ය පොහොර සංස්ථාව .. | 21·8 | 3·0 | — | 227·3 | — | — | 249·1 | 3·0 | — |
| 7. ලංකා තුනී ලෑලි සංස්ථාව .. | — | — | — | 7·1 | — | — | 7·1 | — | — |
| 8. ජාතික පේෂ කර්ම සංස්ථාව .. | 42·0 | 42·0 | 42·0 | — | — | — | 42·0 | 42·0 | 42·0 |
| 9. ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය .. | — | — | — | 8·5 | 5·6 | — | 8·5 | 5·6 | — |
| 10. රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව | — | — | — | 3·5 | — | — | 3·5 | — | — |
| එකතුව .. | 197·7 | 152·0 | 110·6 | 332·4 | 230·6 | — | 530·1 | 382·6 | 110·6 |

(අ) අනුමත ඇස්තමේන්තු.

මූලය : මහා භාණ්ඩාගාරය.

## බලය සහ ඉන්ධන

1990 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය වෙත කරන ලද කාර්මික ඉන්ධන විකුණුම් අත්හල විට, සෙසු කර්මාන්තවලට අලෙවි කරන ලද ඉන්ධනවල වටිනාකම සියයට 4 කින් වැඩිවී ඇත. මෙම වර්ෂය තුලදී උඳුන් තෙල් අලෙවිය සියයට 6 කින් වර්ධනය වී ඇති අතර, බැර ඩීසල් අලෙවිය සියයට 11 කින් පහත වැටුණි.

### 1 . 21 සංඛ්‍යා සටහන

### කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1989 – 1990

| අයිතමය | 1989 | 1990 (අ) |
|---|---|---|
| 1. විදුලි බලය (ගිග වොට් පැය) (ආ) .. | 848·7 | 887·3 |
| 1.1 කුඩා කර්මාන්ත .. | 43·3 | 53·5 |
| 1.2 මධ්‍යම කර්මාන්ත .. | 459·2 | 467·5 |
| 1.3 විශාල කර්මාන්ත .. | 346·2 | 366·3 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙ. ටො. දහස්) (ඇ) | 173·7 | 180·5 |
| 2.1 බැර ඩීසල් | 22·7 | 20·1 |
| 2.2 උඳුන් තෙල් .. | 151·0 | 160·4 |

(අ) තාවකාලික

(ආ) ලංකා විදුලි බල මණ්ඩලය හැර සෙසු ආයතනවලට කෙරුණු විකිණීම්.

(ඇ) නිමැවුම් හා අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයකින් යුත් ඒකක කුඩා කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 50-500 අතරට ගැණෙන ඒවා මධ්‍යම කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා විශාල කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ

මූලයන් : ලංකා විදුලි බල මණ්ඩලය; ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

කර්මාන්ත අංශයේ විදුලිබල භාවිතය 1990 වර්ෂයේදී සියයට 5 කින් වර්ධනය විය. මෙය කුඩා පරිමාණ කර්මාන්තයන්හි සියයට 23 ක, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 2 ක සහ විශාල පරිමාණ කර්මාන්තයන්හි සියයට 6 ක වර්ධනයන්හි සංකලනයකි.

**පෞද්ගලික විදේශීය ආයෝජනය**

**ආයෝජන ප්‍රවර්ධන කලාප**

මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) 1990 ජනවාරි මසදී විදේශීය ආයෝජකයින් වෙනුවෙන් කටයුතු කිරීමේ "එකම ආයතනය" ලෙස ක්‍රියාත්මක වීම සඳහා විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) හා ඒකාබද්ධ කරන ලදී. එමගින් 1990 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 30 ක් "ම. කො. ආ. කො. තත්ත්වයන්" යටතේ අනුමත කරන ලද අතර, වර්ෂය අවසානය වනවිට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 337 දක්වා වැඩිවිය. මෙයින් ව්‍යවසායයන් 194 ක් විවිධ කර්මාන්තයන් ආරම්භ කිරීම සඳහා ම. කො. ආ. කො. සමග ගිවිසුම් ඇතිකර ගන්නා ලද ඒවා විය. 1990 වර්ෂය අවසානය වනවිට, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලුනු ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 120 ක් විය. නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබූ ව්‍යාපෘතීන් අතරින් 65 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක. ආ. ප්‍ර. ක.), තුළද 23 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි. ආ. ප්‍ර. ක.) තුළ සහ ඉතිරි 32 දිවයිනේ සෙසු පලාත්වලද පිහිටා තිබුණි.

1990 වර්ෂයේදී මහ කොළඹ ආර්ථික කොමිසම මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි නිෂ්පාදිතයන් අතර රූපලාවන්‍ය වර්ධන සඳහා යොදගන්නා බුරුසු සහ වෙනත් බුරුසු වර්ග, පාංශු වර්ධකයන්, බලශක්ති පිරිමැසුම් විදුලි බුබුළු, ඔතන ලද නූල්, ශල්‍ය සහ රබර් අත් වැසුම්, අච්චු, මෝටර් රථ අමතර කොටස්, කළුගල් ස්ථර, ගල් ටයර්, ඇඟලුම්, ගමන් මළු, සෙල්ලම්බඩු සහ කොහුබත් නිෂ්පාදිත අන්තර්ගත වේ.

**1 . 22 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය – සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1989 – 1990**

| කාර්මික ගණය | 1989 | | 1990 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) (සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) (සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 1,135 | 379 | 1,633 | 849 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 42,925 | 8,825 | 49,554 | 11,669 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 69 | 9 | 44 | 6 |
| 4. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 2,049 | 405 | 2,765 | 503 |
| 5. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 4,431 | 666 | 5,502 | 1,811 |
| 6. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 1,287 | 621 | 1,436 | 750 |
| 7. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 5,312 | 703 | 6,024 | 1,213 |
| 8. සේවා (ආ) .. | 4,221 | 244 | 4,400 | 724 |
| එකතුව .. | 61,429 | 11,852 | 71,358 | 17,525 |

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.

(අ) තාවකාලික.
(ආ) "එයාර් ලංකා" හැර.

1990 මහ කොළඹ ආර්ථික කොමිසමෙහි ව්‍යවසායයන්හි දළ අපනයන ඉපැයුම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 17,525 ක් (වි. ගැ. හි. දශ ලක්ෂ 322) ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 47.9 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය විගැහි වටිනාකම අනුව බලන කල සියයට 26.3 ක වර්ධනයකි. රෙදිපිළි සහ ඇඟළුම් අංශය මුළු අපනයන ඉපැයුම් වලින් සියයට 66.5 ක ප්‍රමාණයක් හිමිකර ගනී.

මහ කොළඹ ආර්ථික කොමිසම " එකම ආයතනය " ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව " විදේශීය ආයෝජන උපදේශක කමිටු තත්ත්වයන් යටතේ " , මහ කොළඹ ආර්ථික කොමිසමෙහි සහන නොලබන ව්‍යාපෘතීන් 47 ක් සඳහා අනුමැතිය දී ඇත.

මෙම ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,089 ක් වන අතර, එහි විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 280 ක් සහ දේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 809 කි. මෙම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 4,858 ක් වේ.